


# චිරං ජයතු!

# අසූවිය සපුරන ගාන්ධර්වයාණනි



හෙළ ගීයක අප විඳි රස හවි බෙදා ගැනීමට, ඒ ගීය පසුබිමේ සිටිනා නිර්මාණකරුවන් හඳුන්වා දීමට වසර දහ අටක් පුරාවට ලියැවෙන ''සමවැදුම'' ලිපිය මෙවර වෙන්වෙන්නේ හෙළ ගී පුරාවතේ අසම සම විශිෂ්ඨයෙකුගේ අසූ විය සැපිරීම වෙනුවෙන්.

සූර්ය ශංකර් මොල්ලිගොඩ, ආනන්ද සමරකෝන්, සුනිල් සාන්ත, පණ්ඩිත් අමරදේවයන් වැනි පුරෝගාමී සුධීන්ගේ මියැසි සුභාවිතය සිය පසුබිමෙහි ලා තබාගෙන ඒවා ගුරු කොට සළකමින්, ඒ අනුව ම නොයා තමන්ගේම අනන්‍යතාවයක් ගොඩ නංවාගත් මේ මියැසි ගාන්ධර්වයා වෙන් අයෙකු නොව, ආචාර්ය වික්ටර් රත්නායක සංගීතවේදියාණන්.

මීට 80 වසරකට පෙර කඩුගන්නාව ප්‍රදේශයේ ඉපිද, ජන්මයෙන් ගෙන ආ ගායනීය කුසලතාව මෙන් ම වාදනීය හසලතාව වඩාත් ක්‍රමවත්ව ඉදිරියට කරගෙන යන්නට අඩිතාලම දැමුයේ සිය පියාණන් බව ආචාර්ය වික්ටර් රත්නායක සංගීතවේදියාණෝ නිතර සිහිපත් කරති.

අසල්වැසි නිවැසෙක පැවැත්වුණ සාජ්ජයක් රස විඳි අන්දමත්, සාජ්ජකරුවන් විවේකයක් ගත් ඉසිඹුවක ඔවුනගේ 'ෆුට් බැලෝ' සර්පිනාව වැයීමට ගත් උත්සාහයත්, ඔවුන්ගේ අයෙකු කන මිරිකා ටොක්කක් ඇන්න අන්දමත් අසූවිය සපුරන වික්ටර් රත්නායකයන්ට අදටත් මතකයේ ඇත්තේ, ඒ සිය ජීවන ගමන සම්පූර්ණයෙන්ම වෙනත් මඟකට යොමු කළ සිද්ධියක් වූ නිසාවෙනි. මෙය සැළ වූ ජේම්ස් රත්නායක පියාණන් සිය පුතුට ගෙනැවිත් දෙන්නේ ඒ වර්ගයේ ම සර්පිනාවක්. එහි යතුරු අතරින් දිව ගිය කුඩා ඇඟිලිත්, එහි හඬ පරයන්නට ගැයූ ළමා හඬත් අපගේ හෙළ ගී පුරාවතට තවත් එක් ජයග්‍රාහී විශිෂ්ඨතමයෙකු එක් කරවන්නට සමත් විය. කඩුගන්නාව කණිෂ්ඨ විද්‍යාලයේ ශිෂ්‍යයෙකු ලෙසින් නැගුණ එකී ජයග්‍රාහී වික්ටර් හඬ පරයා වාදනය වඩාත් ක්‍රමවත්ව ලබන්නට මුල පිරුණේ මහනුවර එම්. ජී. පී. කලායතනයේ අධිපති සිරිල් පෙරේරා සංගීතාචාර්යවරයා යටතේයි. අද සෞන්දර්ය විශ්ව විද්‍යාලයට අයත් රජයේ සංගීත විද්‍යාලයට ජයග්‍රාහී වික්ටර් තරුණයා සුදුසුකම් ලබා ඇතුළත් වෙන්නේ එය 'හේවුඩ්' ආයතනය ලෙසින් පවත්වා ගෙන ආ සමයේදීයි.

එකල පැවැති ජනප්‍රිය සංගීත කලාවේ පුරෝගාමියෙකු වූ ආර්. ඒ. චන්ද්‍රසේන සංගීතවේදියාණන් සමඟ මුහුවීමත්, ගුවන් විදුලියේ වාදක මණ්ඩලයට වයලීන වාදකයෙකු ලෙස සම්බන්ධ වීමත් ජයග්‍රාහී වික්ටර් වාදකයාණන්ගේ භාෂිත මියැසි දැණුම මෙන්ම අත්දැකීම් පුළුල් කරවීමට හේතු විය.

තමන් උගත්, උත්තර භාරතීය රාගධාරී සංගීතය මෙන්ම දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයත්, අපරදිග සංගීතයත් මැනැවින් මුහුන් ලෙස යොදා ගනිමින් අපගේ ජන ගී ආරයද සමඟින් තමන්ට ම ආවේනික සංගීත නිර්මාණකරණයක නියැලෙන්නට මේ ජයග්‍රාහී මියැසි වේදියාණන් හුරු වූයේ සිය මුල් ම ගීයේ පටන්ම යි.

මුලින් ම සර්පිනාව වැයීමට අත් පොත් තැබූ ඩී. ඒ. ඩී ධර්මදාස මහත්මා සිය මුල් ම සංගීත ගුරුවරයා ලෙස නිරතුරුව වික්ටර් රත්නායකයන් සිහිපත් කරන්නේ ඉතාමත් ම නිහතමානීව. උදයරත්න බ්‍රාහ්මණගම මහත්මා ''සහෝදරයෝ'' නාට්‍යයට ලියූ ''යන්නට සිදු වේ මරණය ආ දා....'' පද රචනාවට තමන් ම තනුවක් සහ සංගීතය නිර්මාණය කරගෙන මුලින් ම ගැයූ ගීතය සම්පූර්ණයෙන්ම හින්දි ගී හෝ රාගධාරී සංගීතයෙන් මිදුණ ස්වායක්ත ගීතයක්. ''එයා ෂිජ්'' ආධුනික තරඟය ට ගැයූ වික්ටර් තරුණ ගායන ශිල්පියා එදා දෙවැනි වූයේ නාන්දා මාලනී යෞවනියට පමණයි.

මෙලෙසින් ළමා වියේ පටන් ම හපන්කම් පෙන් වූ ගායනයත්, වාදනයත් ඇසුරින් වඩාත් නිර්මාණශීලී ගීත නිර්මාණය කිරීමටත් අති විශිෂ්ඨ ලෙසින් ගී ගැයීමටත් දැක් වූ ප්‍රාතිහාර්ය වෙනුවෙන් රසිකයින් මුලින් ම ''දැනෙන'' ප්‍රතිචාරයක් දැක් වූයේ වසර 1973 ජූලි 20 දා ලුම්බිණි රඟහලේදීය. මුල් ම ''ස'' ප්‍රසංග ශාලාවේ දොර ජනෙල් වීදුරු බිඳ ගලා ආ ඒ රසික රළ ප්‍රවාහය අදටත් වියපත් නො වී එලෙසින්ම පැවතීමයි විශ්මය.

ඉන්දීය රාගධාරී සංගීතයට අනුව මන්ද්‍ර මධ්‍යමය නැතිනම් ''මන්ද්‍ර-ම'' ස්වරයේ සිට උච්ච පංචමය නැතිනම් ''උච්ච ප'' දක්වා විසල් ස්වර පරාසයක ඒ ඒ ස්වරවලට හිමි නිවැරදි ස්වරස්ථානවල සජීවීව ගයනා ආචාර්ය වික්ටර් රත්නායකයන් ඒ හපන්කම ස්වර ගායනයක් ලෙසින් ''හෝපලු වනපෙත'' ගීයේදී මාත්‍රා 42 ක කාලයක් දීර්ඝව ගයන්නේ සිය ගායනාවලදී කෙරෙන ස්වසන පාලනය පිළිබඳව ශ්‍රාවකයින් විශ්මයට පත් කරවමින්. එයයි වික්ටර් රත්නායකයන්ගේ ගායනවේදයේ මහිමය.

සිය මධුර තනු වෙනුවෙන් පූර්ව, අන්තර් සංගීත ඛණ්ඩවලට අමතරව ගැයෙන, තනුවට යටින් දිවෙන අනු තනුවක් වැයීම හෙළ ගීයට හඳුන්වා දුන්නේ අචාර්ය වික්ටර් රත්නායක සංගීත වේදියාණන්. පෙර කී සේ ම විවිධ සංගීත ක්‍රමවේද සියුම් ලෙස මුසු කරමින් රත්නායකයන් කළ ගී තනු හා මියැසි නිර්මාණවලියෙන් සිය ගායනා සැරිය ආලෝකමත් කරගත් අන්‍ය ගායන ශිල්පීන් ගණනින් සිය වයස ඉක්මවයි.

ඕනෑම හඬක් සමඟ පෑහෙන රත්නායකයන්ට ම අනන්‍ය වූ  හඬ, ප්‍රේමණීය යෞවනයේ හඬක් ලෙස වැඩි දෙනෙකු හඳුනාගත්ත ද, බොදු බැති ගී, දේශාභිමානී ගී, හාස්‍යෝත්පාදක ගී මෙන්ම වීරෝධාකල්පික ගී ගැයීමේදී ඒ ඒ භාවයන්ට අනුගත කරවමින් ආචාර්ය වික්ටර් රත්නායකයන් පානා 'ගායනීය රංගන පෙළහර' විශ්මය එළවන සුළුයි.

තමන් පමණක් තනිව දිදුළනවා වෙනුවට පරපුරු ගණනක ශිල්පි ශිල්පිණීන්ට සිය මියැසි කැළුම් දායාද කරමින්, කිසිදු ගුරුකුලයකට, දේශපාලනයකට ගැති නො වී ඉන්ද්‍රඛීලයක් සේ එදා මෙන්ම අදටත් නැගී සිටිනා ආචාර්ය වික්ටර් රත්නායක විශිෂ්ඨතම ගාන්ධර්වයාණන්ට නීරෝගීමත් දිගු දිවි සැරියකට සුභාසිංශන 'සමවැදුම' පාඨකයින් වෙනුවෙන් පිරිනමන්නෙමු.

චිරං ජයතු!

*ආශ්‍රිත ග්‍රන්ථ*

1. **'මාරුතයේ මියුරුසර'**
   ගීතනාත් කුඩලිගම
2. **'වික්ටර් ගී විමංසා'**
   සිසිර දිසානායක



සිසිර දිසානායක